# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 69 — 1973 ජූලි 20 වැනි සිකුරාදා — 1973.07.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 744 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 739 | මිළ පාලන දැන්වීම් ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | 740 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | 740 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 742 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්.. ... | 750 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... | — | "සුරාබද්ද අඥපනත" පිළිබඳ දැන්වීම් ... | — |

සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 22 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 23 දරන බඩු උගස් ගන්නන්ගේ (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත 1973 ජූලි 20 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 349**

අංක: ඞී/වීඑප්/9/ඒ (II).

සුද්ධ සමුද්‍රාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපතිතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1973 ජනවාරි මස 01 වැනි දින සිට ලුතිනන්වරුන් වශයෙන් :—

දෙවන ලුතිනන් දොන් ෂෙල්ටන් කැනිෂස් ගනේගොඩ., ලයුසේබ.

දෙවන ලුතිනන් අනිල් සුමේධ අමරසේකර., ගැහේබ.

දෙවන ලුතිනන් රන්පටබැඳිගේ නිහාල් වීරවර්ණ නිලවීර., ලසිරේ.

දෙවන ලුතිනන් කුරුවිකන්කානගේ ප්‍රේමලාල් නන්ද ප්‍රනාන්දු., ලපාහ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි 4 දින,
කොළඹ දී ය.

7-825—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් පමාවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

739—බී 70952—10,662 (73/7)

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 350**

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත**

අංකය : අමප. 235/73.

වැඩ අධ්‍යක්ෂ යී. ආර්. තිස්සෙයිනායගම් මහතා 1973 මැයි 1 වැනිදා සිට වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ,
1973 ජූලි මස 6 වැනි දින.

7–785—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

**1973 අංක 351**

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම් කර ඇත**

අංකය : අමප. 29/73.

සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස් මහතා 1973 අප්‍රේල් මස 12 වැනි දින සිට 1973 අප්‍රේල් මස 27 වැනි දින දක්වා දිවයිනෙන් බැහැරව සිටිකාලය තුළ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ වී. සිවසම්බු මහතා සත්වෝද්‍යාන අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරීන්හි යෙදීමට.

අංකය : අමප. 280/73.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ එම්. ආර්. ප්‍රනාන්දු මහතා 1973 මැයි 02 වැනි දින සිට නැවත නියම යක් කරන තුරු ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ උතුරු දිසාවේ වැඩ අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 170/73.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ එස්. පද්මනාදන් මහතා 1973 ජනවාරි මස 22 දින සිට නැවත නියමයක් කරනා තුරු ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ දකුණු දිසාවේ වැඩ අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 174/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ එස්. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා 1973 අප්‍රේල් මස 02 දින සිට නැවත නියමයක් කරනා තුරු සමාජ සේවා අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 174/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ ඩී. එච්. ජේ. අබේගුණ සේකර මහතා 1973 අප්‍රේල් මස 02 දින සිට නැවත නියමයක් කරන තුරු හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන්.

අංකය : අමප. 188/73.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ආර්. පාස්කරලිංගම් මහතා 1972 අගෝස්තු මස 04 දින සිට දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ එන්. ජී. ඊ. ඩබ්ලිව්. ජී. සෙනෙවිරත්න මහතා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 222/73.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් පී. එච්. සිරිවර්ධන මහතා තම රජකාරීන්ට අමතරව 1973 අප්‍රේල් මස 09 දින සිට රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 223/73.

සමාගම් රෙජිස්ට්‍රාර් ආර්. එල්. ද සිල්වා මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් වී. එස්. නඩරාජන් මහතා 1973 අප්‍රේල් මස 07 දින සිට සමාගම් රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 224/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ ඩී. අලුවිහාරේ මහතා 1973 අප්‍රේල් මස 01 දින සිට නැවත නියමයක් කරන තුරු තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

අංකය : අමප. 234/73.

වැඩබලන සර්වේ ජනරාල් ආර්. ඒ. ගුණවර්ධන මහතා වෛද්‍ය නිවාඩු පිට රාජකාරියට නොපැමිණෙන කාලය තුළ නියෝජ්‍ය සර්වේ ජනරාල් ඒ. එම්. කුමාරස්වාමි මහතා 1973 පෙබරවාරි මස 21 දින සිට සර්වේ ජනරාල් වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 245/73.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ එස්. මුදලිගේ මහතා 1973 ජනවාරි මස 01 දින සිට නැවත නියමයක් කරනා තුරු යන්ත්‍රෝපකරණ අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 275/73.

කම්කරු කොමසාරිස් ඩබ්ලිව්. එල්. පී. ද මැල් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ ජේ. පී. ඊ. සිරිවර්ධන මහතා 1973 ජූනි මස 05 දින සිට කම්කරු කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ.
1973 ජූලි මස 05 දින.

7-786—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

# අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

1973 අංක 352

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත :—

ඩී. එම්. වරුසවිතාන මහතා වෙනත් රාජකාරිවලට යෙදී සිටින තෙක් හෝ නැවත නියමයක් කරනතුරු, ඒෆ්. එන්. ඩී. ජයසූරිය මහතා 1973 ජූලි මස 01 වන දින සිට 1973 ජූලි මස 16 දින දක්වා අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

ආර්. බී. රණරාජා මහතා 1973 ජූලි මස 01 වන දින සිට 1973 ජූලි මස 16 වන දින තෙක් හෝ නැවත නියමයක් කරනතුරු අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් හා බම්බලපිටියේ පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, පානදුර අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, මීගමුව අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ගම්පහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

ඊ. ඩී. ජී. ද අල්විස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් පානදුර දි. උ. අංක 11,447 හා 11,064 දරණ නඩුවල තීන්දුදීම පිණිස 1973 අගෝස්තු මස 02 දින සිට පානදුර අතිරේක දිස්ත්‍රික් තඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවැත නියමයක් කරනතුරු, එම්. කේ. සෙල්වරාජා මහතා 1973 ජූනි මස 04 සහ 05 දින යන්හි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් සහ තම්පලාකාමම් පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඩබ්ලිව්. ඒ. බී. ඕ. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සිරිමල් ඒ. ඊ. පිංතු මහතා 1973 ජූනි මස 27 වැනි දින පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු සහ කඩවත් කල්පිටි රාජවන්නි පළාත් සහ කුමාර වන්නි පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ පිටිගල් කෝරළේ උතුරු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. බී. තෙලෙසිංහ මහතා 1973 ජූනි මස 30 වැනි දින සහ ජූලි මස 02 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, නිකවැරටිය, ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ හිරියාල හත්පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

එල්. සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. 573,
සී. 52, කැප්පෙටිපොල පාර,
1973 ජූලි මස 03 වැනි දින,
කොළඹ 5 දීය.

7-679 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

# වෙනත් පත්කිරීම් ආදිය

## 1973 අංක 353

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

ඒබ්‍රහම්ස් සහ ද අල්විස් සමාගමේ රුක්මල් වීරකෝන් මහත්මිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ජූනි මස 30 දින,
කොළඹ දී ය.

7-725—53.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 354

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

ගල්කිස්සේ ගාලු පාරේ "නන්දනා" අංක 186 හි පදිංචි බෙමිනි හෙන්නඩිගේ එඩ්මන් ජොහන්නස් ප්‍රනාන්දු මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ජූනි මස 30 දින,
කොළඹ දී ය.

7-724 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 355

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

කුඹුක ඇරණියගල වලව්වේ පදිංචි සමරසුන්දර ආරච්චිගේ පීටර් සමරසුන්දර මහතා කුඹුක වාසස්ථානය සහ කාර්යාලය ද හොරණ නගරයේ අතුරු කාර්යාලය ද ඇතුව පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 05 දින,
කොළඹ දී ය.

7-723—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 356

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

මතුගම පදිංචි දේවගේ දොන් සෝමසිරි සිරිපාල මහතා මතුගම් නෑබොඩ පාරේ අංක 62 දරණ ස්ථානයේ වාසස්ථානය සහ කාර්යාලය ද වලල්ලාවිට අතුරු කාර්යාලය ද ඇතුළුව කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 05 දින,
කොළඹ දී ය.

7-715 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 357

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

බද්දේගම පදිංචි රොබර්ට් සූරිආරච්චි මහතා බද්දේගම් බස්හන්දියේ වාසස්ථානය සහ කාර්යාලය ද උනන්විටියේ අතුරු කාර්යාලයද ඇතුළුව ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය, පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 05 දින,
කොළඹ දී ය.

7-718—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 358

### නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

මීටියාගොඩ පදිංචි මද්දුම කුමාරගේ සෝදිස් ප්‍රෙමවර්ධන කුමාර රත්න මහතා මීටියාගොඩ බලිමුල්ලේ වාසසථානය සහ කාර්යාලය ද මීටියාගොඩ අතුරු කර්යාලය ද ඇතුව ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 05 දින,
කොළඹ දී ය.

7-721 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 359**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

වලස්මුල්ලේ පදිංචි පලිහපිටිය ගමගේ සිරිල් ඩයස් මහතා වලස්මුල්ලේ වාසස්ථානය සහ කාර්යාලය ද මිද්දෙණියේ අතුරු කාර්යාලය ද ඇතුව තංගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය. පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-719 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 360**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

මහනුවර පදිංචි මොහමඩ් සහීඩ් මොහමඩ් මුහුසීන් මහතා මහනුවර පැවිලියන් විදියේ අංක 43 දරණ ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ද ගලගෙදර මඩිගේ අතුරු කාර්යාලය ද ඇතුව මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-722 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 361**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

පේරාදෙනියේ පදිංචි සෙනෙවිරත්න මුදියන්සේලාගේ චන්ද්‍ර විස්තු බණ්ඩාර සෙනෙවිරත්න මහතා මහනුවර පැවිලියන් විදියේ අංක 17 දරණ ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ද මැදගොඩ ගලගෙදර අතුරු කාර්යාලය ද ඇතුව මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-720 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 362**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

කරදගොල්ලේ ඇහැලමල්පේ පදිංචි රුද්‍රිගු මුහන්දිරම් රාලහාමිලාගේ ඇල්ප්‍රඩ් පෙරේරා කරුණාතිලක මහතා රිකිල්ලගස්කඩ ප්‍රධාන කාර්යාලය ද ඇතුව මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-717 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 363**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

අලව්වේ පදිංචි හේරත් මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩාර මහතා අලව්වේ වාසස්ථානය සහ කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-716 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 364**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

වැල්ලව මැද්දේගම පදිංචි ජෝර්ජ් ස්ටීවන් ධර්මතිලක මහතා කුරුණෑගල නගරයේ ප්‍රධාන කාර්යාලය ද රිදීගම අතුරු කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-714 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 365**

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

කුළියාපිටියේ මිහිඳු මාවතේ "වජිර කාන්ති" නිවසේ පදිංචි ඉන්ද්‍රානි දමයන්ති ගුණතිලක මහත්මිය කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි සහ සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 දින,
කොළඹ දී ය.

7-824—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 129/49.

## යුද්ධ හමුදා පනත

අංක : ඩී. 237/ආර්ජීසීපී.

(357 වැනි අධිකාරය වන) යුද්ධ හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 ජූලි මස 10 වෙනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1950 මාර්තු 17 වැනි දින අංක 10,085 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ වරින් වර සංශෝධනය කරන ලද, 1950 දෙබිළ සේවා නියෝග පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි වූ 3 වැනි නියෝගය වෙනුවට පහත සඳහන් නව නියෝගය ආදේශ කිරීමෙන් :—

"(3) යම් යුද්ධ හමුදා භටයෙක් ඔහුගේ මුල් සේවා කාලය ඉක්මීමට ප්‍රථම නිත්‍ය හමුදාවේ සේවය කිරීම සඳහා නැවත සේවයේ යොදවා ගත හැකිය. එබඳු වැඩි දුර සේවාව, සේවා කාලයන් එකකින් හෝ ඊට වැඩි ප්‍රමාණය කින් යුක්ත විය හැකි නමුත් එබඳු සේවා කාල මුළු එකතුව අවුරුදු විස්සකට වැඩි නොවිය යුතුය. ඒ කෙසේ වෙතත් කිසිම යුද්ධ හමුදා භටයෙක් වයස අවුරුදු පනස් පහ ඉක්මවා සේවය නොකළ යුතුය."

(2) එහි වූ 9 වැනි නියෝගයෙහි (1) වැනි ඡේදයෙහි "ස්ථිර ලේකම්, යුද්ධ හමුදා ආඥාපතිගේ උපදෙස් ඇතිව" යන වචන වෙනුවට "යුද්ධ හමුදා ආඥාපති" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි වූ 11 වැනි නියෝගයෙහි "ස්ථිර ලේකම්" යන වචන වෙනුවට "යුද්ධ හමුදා ආඥාපති" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එහි වූ 15 වැනි නියෝගයෙහි "ඔහු නැවත සේවයේ යොදවන ලද සේවා කාලයේ දහවෙනි අවුරුද්දේදී" යන වචන වෙනුවට "ඔහු නැවත සේවයේ යොදවන ලද සේවයේ දහවෙනි අවුරුද්දේදී" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එහි වූ 17 වැනි නියෝගයෙහි "ඔහු නැවත සේවයේ යොදවන ලද සේවා කාලයේ දහවෙනි අවුරුද්දේදී" යන වචන වෙනුවට "ඔහු නැවත සේවයේ යොදවන ලද සේවයේ දහවෙනි අවුරුද්දේදී" යන වචන ආදේශ කිරීමෙන්.

7-826/1—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 111/50.

## නාවික හමුදා පනත

අංක : ඩී. 237/ආර්ජීසීපී.

1692 අංක 11 දරන පනතින් සංශෝධිත (358 වැනි අධිකාරය වන) නාවික හමුදා පනතේ 161 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 ජූලි මස 10 වෙනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1950 දෙසැම්බර් මස 9 වැනි දින අංක 10,187 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ වරින් වර සංශෝධිත පරිදි වූ 1950 නාවිකයන් බඳවා ගැනීමේ සහ සේවා නියෝග පහත සඳහන් අංයුරු මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි වූ 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි, 11 වැනි සහ 12 වැනි නියෝග වෙනුවට පහත සඳහන් නියෝග පිළිවෙළින් ආදේශ කිරීමෙන් :—

"7. (අ) ගැසට් පත්‍රයෙහි මෙම නියෝගය පළ කරනු ලැබූ දිනට පෙරාතුව බඳවාගත් හෝ බඳවාගනු ලැබ සිටින නාවිකයකුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවුරුදු දොළහක් විය යුතු අතර ඔහු විසින් එම කාලය ස්ථිර නාවික බල හමුදාවේ සේවය කළ යුතු ය.

(ආ) ගැසට් පත්‍රයෙහි මෙම නියෝගය පළ කරනු ලැබූ දිනට පසුව බඳවාගත් හෝ බඳවාගනු ලබන නාවිකයකුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය පහත සඳහන් පරිදි විය යුතුය :—

(i) ඔහු නාවික හමුදාවේ යම්කිසි ශිල්පී අංශයකට බඳවා ගනු ලැබුවේ නම් ඔහුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවුරුදු දොළහක් විය යුතු අතර ඔහු විසින් එම කාලය ස්ථිර නාවික බල හමුදාවේ සේවය කළ යුතුය.

(ii) ඔහු ශිල්පී අංශයන්ගෙන් එකක් නොවන වෙනත් යම් අංශයකට බඳවා ගන්නේ නම් ඔහුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවුරුදු දොළහක් විය යුතු අතර ඔහු විසින් ඉන් පළමු අවුරුදු පහ ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කළ යුතුය. නාවික හමුදාධිපති විසින් අන් අයුරකට නියෝග නොකළේ නම් ඉතිරි අවුරුදු හත ස්ථිර නාවික උපසේවයෙහි සේවය කළ යුතු ය. ඉහත සඳහන් පස් අවුරුදු කාලය ගෙවී යෑමට පෙර, ඔහු ස්ථිර නාවික බල හමුදාවෙහි නවත්වා ගැනීම අවශ්‍ය යැයි සැලකේ නම්, ස්ථිර නාවික බල හමුදාවෙහි ඔහුගේ සේවය අවුරුදු හතකට අධික නොවන කාලයක් දික් කිරීමට අවසර දිය හැකිය.

8. (i) නාවිකයකු ඔහුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය ගෙවී යෑමට පෙර අවුරුදු විස්සකට අධික නොවන ලෙස කාල පරිච්ඡේද එකක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා ස්ථිර නාවික බල හමුදාවෙහි සේවයට නැවත යොදවා ගත හැකිය.

(ii) 8(i) වැනි නියෝගය යටතෙහි නැවත යොදවා ගනු ලබන යම්කිසි නාවිකයකු ප්‍රථම වශයෙන් අවුරුදු දහයකට අධික නොවන කාලයක් සේවය කළ යුතු අතර, එම කාලය අවසන් වූ විට, නැවත යොදවා ගැනීමේ සේවය එකතුව අවුරුදු විස්සකට අධික නොවන ලෙසද, කෙසේ වුවද ඔහුගේ ප්‍රථම බඳවා ගැනීමේ දින සිට මුළු සේවා කාලය අවුරුදු තිස් දෙකකට අධික නොවන ලෙසද, තවදුරටත් කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේදයන් සඳහා සේවය කිරීමට නැවත යොදවා ගත හැකි ය.

කෙසේ වුවද කිසිම නාවිකයකුට කවර හෝ හේතුවක් නිසාවත් වයස අවුරුදු පනස් පහ ඉක්මවා සේවය කිරීමට ඉඩ නොදිය යුතු ය.

9. ඉහත 7 වැනි නියෝගයෙහි සඳහන් පස් අවුරුදු කාලය ඉක්මවා ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය දික් කිරීමක් හෝ සෑම ප්‍රථම බඳවා ගැනීමේ හෝ නැවත යොදවා ගැනීමේ කාල පරිච්ඡේදයක්ම ඉක්මවා ස්ථිර නාවික බල හමුදා සේවයෙහි නැවත යොදවා ගැනීමක් සඳහා නාවික හමුදාධිපතිගේ තනි අභිමතය අනුව අවසර දිය හැකිය.

10. එවැනි සේවයෙහි දික් කිරීමකට හෝ නැවත යොදවා ගැනීමකට කැමති වන—

(අ) කාර්යක්ෂම වූ, යහපත් හැසිරීමෙන් යුතු වූ හා තමාගේ අණ දෙන නිලධාරියා විසින් නිර්දේශ කරනු ලැබුවා වූ; සහ

(ආ) නාවික හමුදාධිපති සෑහීමකට පත් වන පරිද්දෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථව සිටින්නා වූ

නාවිකයකුට පෙරාතුව වූ නියෝගයේ විධිවිධානවලට යටත් ව ඉහත 7 වැනි නියෝගයේ සඳහන් පස් අවුරුදු කාලය ඉක්මවා ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය දික් කිරීමක් හෝ ප්‍රථම බඳවා ගැනීමේ හෝ නැවත යොදවා ගැනීමේ කාල පරිච්ඡේදයක් ඉක්මවා ස්ථිර නාවික බල හමුදා සේවයෙහි නැවත යොදවා ගැනීමක් සඳහා අවසර දිය හැකි ය.

11. (අ) 7 (ආ) (II) නියෝගයෙහි සඳහන් පස් අවුරුදු කාලය ඉක්මවා ස්ථිර නාවික බල හමුදාවේ සේවය දික් නොකරනු ලැබූ යම් නාවිකයකු, නාවික හමුදාධිපති විසින් අන් අයුරකට නියෝග නොකළේ නම්, ඔහුගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලයෙහි ඉතිරි හත් අවුරුදු කාලය සේවය කිරීම සඳහා ස්ථිර නාවික උප සේවයට මාරුකළ යුතුය.

(ආ) ප්‍රථම බඳවා ගැනීමේ කාලය හෝ නැවත යොදවා ගැනීමේ කාලය ඉක්මවා නැවත යොදවා නොගන්නා ලද යම්කිසි නාවිකයකු පස් අවුරුදු කාලයක සේවය සඳහා ස්ථිර නාවික උප සේවයට මාරු කළ හැකි ය.

12. සේවය දික් නොකරන ලද හෝ ප්‍රථම බඳවා ගැනීමේ හෝ නැවත යොදවා ගැනීමේ කාලය ඉක්මවා නැවත යොදවා නොගන්නා ලද හෝ ස්ථිර නාවික උප සේවයට මාරු නොකරන ලද නාවිකයකු නාවික හමුදාවෙන් සේවා මුක්ත කළ යුතුය."

(2) එහි වූ පළමුවැනි උපලේඛනයෙහි අ ආකෘතියෙහි දැන්වීමෙහි (1) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් අළුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"1. (අ) නාවික හමුදාවෙහි යම්කිසි ශිල්පී අංශයකට ඔබ බඳවා ගත්තෙහි නම්, ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහක කාලයක් ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කිරීමට ඔබ බැඳෙන්නෙහි ය.

(ආ) ඔබ ශිල්පී අංශයන්ගෙන් එකක් නොවන වෙනත් යම් අංශයකට බඳවා ගත්තෙහි නම් ඔබගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහෙන් පළමු අවුරුදු පහ ඔබ විසින් ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කළ යුතු අතර නාවික හමුදාධිපති විසින් අන් අයුරකට නියෝග නොකළේ නම් ඉතිරි අවුරුදු හත ස්ථිර නාවික උප සේවයෙහි සේවය කළ යුතුය. ඉහත සඳහන් පස් අවුරුදු කාලය ගෙවී යෑමට පෙර, ඔබ ස්ථිර නාවික බල හමුදාවෙහි නවත්වා ගැනීම අවශ්‍ය යැයි සැලකේ නම්, ස්ථිර නාවික බල හමුදාවෙහි ඔබගේ සේවය අවුරුදු හතකට අධික නොවන කාලයක් දික් කිරීමට ඉඩ දිය හැකිය.

(ඇ) ස්ථිර නාවික බල හමුදාවෙහි ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවසන් වූ විට ස්ථිර නාවික උප සේවයෙහි අවුරුදු පහකට අධික නොවන කාලයක් සේවය කිරීමට ඔබ වෙත නියම කළ හැකිය.

(ඈ) ඔබ නාවික හමුදාවෙන් සේවා මුක්ත කිරීමට සුදුසු වන කාලයෙහි මුළු නාවික හමුදාව හෝ ඉන් කොටසක් සක්‍රිය සේවයෙහි යෙදී ඇත්නම් ජනාධිපතිතුමාගේ ආඥාවකින් එම සක්‍රිය සේවා කාලය තුළ නාවික හමුදාවෙහි ඔබේ සේවය දීර්ඝ කරනු ලැබේ."

(3) එහි වූ පළමුවැනි උපලේඛනයෙහි අ ආකෘතියෙහි දැන්වීමෙහි 13 වැනි ප්‍රශ්නය වෙනුවට පහත සඳහන් අළුත් 13 වැනි ප්‍රශ්නය ආදේශ කිරීමෙන් :—

"13. පහත සඳහන් කොන්දේසි උඩ සේවය කිරීමට ඔබ කැමැත්තෙහි ද ? :—

(අ) නාවික හමුදාවෙහි යම්කිසි ශිල්පී අංශයකට ඔබ බඳවා ගත්තෙහි නම්, ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහක් ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කිරීම,

(ආ) ඔබ ශිල්පී අංශයන්ගෙන් එකක් නොවන වෙනත් යම් අංශයකට බඳවා ගත්තෙහි නම් ඔබගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහෙන් පළමු අවුරුදු පහ ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කිරීම සහ ඉතිරි අවුරුදු හත ස්ථිර නාවික උප සේවයෙහි සේවය කිරීම,

(ඇ) ස්ථිර නාවික බල හමුදාවෙහි ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවසන් වූ විට ස්ථිර නාවික උප සේවයෙහි අවුරුදු පහකට අධික නොවන කාලයක් සේවය කිරීම,

(ඈ) ඔබ නාවික හමුදාවෙන් සේවා මුක්ත කිරීමට සුදුසු වන කාලයෙහි මුළු නාවික හමුදාව හෝ ඉන් කොටසක් සක්‍රිය සේවයේ යෙදී ඇත්නම් ජනාධිපතිතුමාගේ ආඥාවකින් එම සක්‍රිය සේවා කාලය තුළ නාවික හමුදාවෙහි ඔබේ සේවය දීර්ඝ කිරීම."

(4) එහි වූ පළමුවැනි උපලේඛනයෙහි ආ ආකෘතියෙහි සහතික කිරීමේ පත්‍රයෙහි 13 වැනි ප්‍රශ්නය වෙනුවට පහත සඳහන් අළුත් 13 වැනි ප්‍රශ්නය ආදේශ කිරීමෙන් :—

"13. පහත සඳහන් කොන්දේසි උඩ සේවය කිරීමට ඔබ කැමැත්තෙහි ද ? :—

(අ) නාවික හමුදාවෙහි යම්කිසි ශිල්පී අංශයකට ඔබ බඳවා ගත්තෙහි නම්, ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහක් ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කිරීම.

(ආ) ඔබ ශිල්පී අංශයන්ගෙන් එකක් නොවන වෙනත් යම් අංශයකට බඳවා ගත්තෙහි නම්, ඔබගේ ප්‍රථම බඳවා ගැනීමේ කාලය වන අවුරුදු දොළහෙන් පළමු අවුරුදු පහ ස්ථිර නාවික බල හමුදාවෙහි සේවය කිරීම සහ ඉතිරි අවුරුදු හත ස්ථිර නාවික උප සේවයෙහි සේවය කිරීම.

(ඇ) ස්ථිර නාවික බල හමුදාවෙහි ප්‍රථම බඳවා ගැනීමේ කාලය අවසන් වූ විට ස්ථිර නාවික උප සේවයෙහි අවුරුදු පහකට අධික නොවන කාලයක් සේවය කිරීම.

(ඈ) ඔබ නාවික හමුදාවෙන් සේවා මුක්ත කිරීමට සුදුසු වන කාලයෙහි මුළු නාවික හමුදාව හෝ ඉන් කොටසක් සක්‍රිය සේවයෙහි යෙදී ඇතිනම් ජනාධිපතිතුමාගේ ආඥාවකින් එම සක්‍රිය සේවා කාලය තුළ නාවික හමුදාවෙහි ඔබේ සේවය දික් කිරීම."

7-826/2—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 130/50.

### ගුවන් හමුදා පනත

අංක : ඩී. 237/ආර්ඊසීඊ.

(359 වැනි අධිකාරය වන) ගුවන් හමුදා පනතේ 155 වැනි වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 ජූලි මස 10 වෙනි දින,
කොළඹ දී ය.

### නියෝගය

1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ වරින්වර සංශෝධනය කරන ලද 1951 රාජකීය ලංකා ගුවන් හමුදාවේ (නිත්‍ය හා නිත්‍ය උපසේවා) නියෝග මෙයින් පහත සඳහන් අයුරු තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) 40 වැනි නියෝගයෙහි—

(අ) එහි වූ (1) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් නව ඡේදය ආදේශ කිරීමෙන්—

"(1) යම් ගුවන් භටයෙක් ඔහුගේ මුල් සේවා කාලය ඉක්මීමට ප්‍රථම තවදුරටත් නිත්‍ය ගුවන් හමුදාවෙහි සේවය කිරීම සඳහා නැවත සේවයේ යොදවා ගත හැකිය. එබඳු වැඩිදුර සේවාව, සේවා කාලයන් එකකින් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් යුක්ත විය හැකි නමුත් එබඳු සේවා කාල මුළු එකතුව අවුරුදු විස්සකට වැඩි නොවිය යුතුය. කෙසේ වෙතත්, කිසිම ගුවන් භටයෙක් වයස අවුරුදු පනස් පහ ඉක්මවා සේවය නොකළ යුතුය."

(ආ) එහි වු (1) වැනි ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් නව ඡේදය (2) වැනි ඡේදය වශයෙන් එකතු කිරීමෙන් :—

"(2) නිත්‍ය හමුදාවේ නැවත සේවයේ යෙදීමට කැමති යම් ගුවන් භටයෙකු—

(I) සේවය සඳහා සුදුසු සෞඛ්‍යයෙන් යුක්තව ; හා

(II) කාර්යක්ෂමව හා මනා කල් ක්‍රියාවෙන් යුක්තව සිටි නම් ඔහුට නැවත සේවයේ යෙදීමට ඉඩ දිය හැකිය" ; තවද (ඇ) එහි වූ දැනට පවතින (2) ඡේදය (3) යනුවෙන් නැවත අංක කිරීමෙන් ;

(2) 42 වැනි නියෝගයේ "ස්ථිර ලේකම්" යන වචන වෙනුවට "ගුවන් හමුදාධිපති" යන වචන ආදේශ කිරීමෙන්.

7-826/3—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත**

පැලවත්ත මානසික ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1974 දෙසැම්බර් මස 31 වන දායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය පැලවත්ත මානසික ආරෝග්‍ය ශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් ආයුර්වේද වෛද්‍ය ඩී. ඊ. හපුහෙට්ටි මහතා නම් කරනු ලැබීය.

සී. ඊ. එස්. වීරතුංග,
සෞඛ්‍ය ලේකම්.

1973 ජූලි මස 09 දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

**නාම ලේඛනය**

1. ආයුර්වේද වෛද්‍ය ඩී. ඊ. හපුහෙට්ටි මහතා, ස.වි. (සභාපති).
2. ආතර් විජේසිංහ මහතා.
3. සෝතින් ද වැරණියගොඩ මහතා.
4. හේමරත්න ජයවර්ධන මහතා.
5. ආර්ලිස් කළුගල ආරච්චි මහතා.
6. ඇල්. හපුආරච්චි මහතා.
7. දිස්ත්‍රික් ඉංජිනේරු, කළුතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කළුතර.
8. කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරී, කළුතර.
9. මානසික සෞඛ්‍ය සේවා අධිකාරී, අංගොඩ.

7-667—73. 07. 20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත**

කුරුණෑගල ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතෙහි 1974 දෙසැම්බර් මස 31 වන දායින් අවසන් වන කාල සීමාවට පහත සඳහන් අය කුරුණෑගල ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ. එහි සභාපති වශයෙන් සරත් පතිරත්න මහතා නම් කරනු ලැබීය.

සී. ඊ. එස්. වීරතුංග,
සෞඛ්‍ය ලේකම්.

1973 ජූලි මස 09 දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

**නාම ලේඛනය**

1. සරත් පතිරත්න මහතා (සභාපති).
2. එස්. එම්. බී. සිරිවර්ධන මහතා.
3. ඩී. පී. ජයසේකර මහත්මිය, ස. වි.
4. ඇස්. ඇල්. ඇම්. ඉසදීන් මහතා, ස.වි.
5. පී. ඇම්. ජයතිලක මහතා.
6. එස්. එල්. එම්. කාසිම්. මහතා.
7. එච්. අබේරත්න මහතා.
8. සිරිසේන මල්ලවාරච්චි මහතා.
9. බී. දනන්සූරිය මහතා.
10. සිරිසේන සුබසිංහ මහතා, ස.වි.
11. ඒ. බී. සමරසේන මහතා.
12. එච්. එම්. කුමාරදාස මහතා, ස.වි.
13. ඇම්. ඩාලින් සිල්වා මහතා.
14. කේ. පී. ඒ. මාළනාව මහතා.
15. ඇස්. ඒ. ජයසිංහ මහතා.
16. නාගරික කොමසාරිස්, කුරුණෑගල.
17. අධිකාරී ඉංජිනේරු (ගොඩනැගිලි) මධ්‍යම කොට්ඨාශය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මහනුවර.
18. සෞඛ්‍ය සේවා අධිකාරී, කුරුණෑගල.

7-674—73. 07. 20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**

16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, "සමස්ත ලංකා කාන්තා සුබසාධක බලමණ්ඩලයේ වැඩිහිටි නිවාසය" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතන යක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 ජූලි මස 11 වැනි දින,
කොළඹ දිය.

7-771—73. 07. 20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**මිල පාලන පනත**

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර) විසින් පනවනු ලැබූ, 1973 මැයි මස 25 දින අංක 61 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, අංක කේ ඩී/146 දරණ මිල නියෝගය (පාන්) සහ අංක කේ ඩී/147 දරණ මිල නියෝගය (තිරිඟු පිටි) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973 06. 30 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 ජූලි මස 02 වැනි දින,
කොළඹ දීය.

7-545—73. 07. 20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

හලාවත අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් නාත්තන්ඩියේ පදිංචි ධම්මිකා මැණිකේ විජයලක්ෂ්මී වීරකෝන් මහත්මියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ ජූලි මස 5 වැනි දින,
කොළඹ දී ය.

7-726—73. 07. 20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**ආඥා අංක 16.**

1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පණතේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම මහ වැලි සංවර්ධන මණ්ඩලයට අවශ්‍යවී ඇත්තා වූද පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තා වූද ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : වාරි. වි. ම./ලේ—ඩබ්/එම්ඩී/එල්ඒ/5/73
යොමු අංකය : ම. ස. ම.—ඊ එන් ජී/බීඕ.ඩබ්/13.
1973 ජුලි මස 5 වන දින,
කොළඹ දීය.

**උපලේඛනය**

ශ්‍රී ලංකා ජන රජයේ මධ්‍යම පලාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඕ. පල්ගල ග්‍රාම සේවක වසමට අයිති බෝවතැන්න ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 14, රූ. 1 ප. 34 ක් පමණ වූ ඉඩම් කැබැලි හයට මායිම්:—

අවසාන ගම් පිඹුරු අංක 534.

**ලොට් අංක : 38.**

ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, ප. 14.
උතුරට : ලොට් අංක 37 ;
දකුණට : ලොට් අංක 37 ;
නැගෙනහිරට : එම ඉඩම ලොට් අංක 38 ;
බස්නාහිරට : ලොට් අංක 37.

**ලොට් අංක : 37.**

ප්‍රමාණයෙන් අ. 5, රූ. 1, ප. 12.
උතුරට : බෝවතැන්න ඇල ;
දකුණට : අඹන් ගඟ ;
නැගෙනහිරට : එම ඉඩම ලොට් අංක 37 සහ 38 ;
බස්නාහිරට : ලොට් අංක 33.

**ලොට් අංක : 33.**

ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 11.
උතුරට : බෝවතැන්න ඇල ;
දකුණට : අඹන් ගඟ ;
නැගෙනහිරට : ලොට් අංක 37 ;
බස්නාහිරට : එම ඉඩම ලොට් අංක 33.

**ලොට් අංක : 33.**

ප්‍රමාණයෙන් අ. 2, රූ. 2, ප. 12.
උතුරට : බෝවතැන්න ඇල ;
දකුණට : එම ඉඩම ලොට් අංක 33 ;
නැගෙනහිරට : අඹන් ගඟ සහ එම ඉඩම ලොට් අංක 33 ;
බස්නාහිරට : බෝවතැන්න ඇල.

**ලොට් අංක : 56.**

ප්‍රමාණයෙන් අ. 5, රූ. 0, ප. 27.
උතුරට : එම ඉඩම ලොට් අංක 56 ;
දකුණට : ලොට් අංක 37 ;
නැගෙනහිරට : වී සාලාවේ ඇල ;
බස්නාහිරට : ලොට් අංක 38 සහ 40.

**ලොට් අංක : 57.**

ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 38.
උතුරට : ලොට් අංක 56.
දකුණට : වී සාලාවේ ඇල ;
නැගෙනහිරට : වී සාලාවේ ඇල ;
බස්නාහිරට : ලොට් අංක 56 සහ 37.

හිමිකම් කියන අය : එම්. ජෙයිනුලබ්දීන්, එස්. මොයිඩීන් මාරුක්කාර්, සී. පී. ගොපල්ලාව සහ වෙනත් අය.

7-591—73.07.20 අංක 69 දරන ගැසට් පත්‍රය

---

ඇල්ඕබී 59/41

**ධීවර ආඥාපනත**

(212 වැනි අධිකාරිය වන) ධීවර ආඥාපනතේ 20 (2) වැනි සහ 33 වැනි වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ධීවර ඇමතිවරයා විසින් පනවනු ලැබ, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය :—

ජෝර්ජ් රාජපක්ෂ,
ධීවර ඇමති.

1973 ජුනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

1909 දඩ සත්වාරක්ෂක ආඥාපනත යටතේ පනවනු ලැබ, 1938 දෙසැම්බර් 2 වැනි දින අංක 8,417 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, (212 වැනි අධිකාරය වන) ධීවර ආඥාපනතේ 36 වැනි වගන්තියෙන් වලංගුව පවත්වා ගෙන යනු ලැබූ, කලින් කල සංශෝධිත නියෝග, එහි 4 වැනි නියෝගයේ (3) වැනි ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(4) මෙම නියෝගවල අනිකුත් විධිවිධානවල කුමක් සඳහන් වුවද, එය නොතකා—

(අ) එහි පළමුවැනි උපලේඛනයේ 7 වැනි ඡේදයෙහි විස්තර කොට ඇති හම්බන්තොට වරායෙහි කිසියම් වර්ෂයක දී පාවිච්චිය සඳහා ලියාපදිංචි කළ හැකි සම්පූර්ණ මාදැල් සංඛ්‍යාව 25 ට වැඩි නො විය යුතු ය.

(ආ) 1972 වර්ෂය සඳහා හම්බන්තොට වරායෙහි පාවිච්චි කිරීම පිණිස ලියාපදිංචි කරනු ලැබූ දැල් හිමි තැනැත්තන් කණ්ඩායමේ සාමාජිකයකුට අයත් මාදැලක් හැර වෙන කිසිම මාදැලක් එම වරායෙහි පාවිච්චි කිරීම සඳහා ලියාපදිංචි නො කළ යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදයෙහි සඳහන් තැනැත්තන් කණ්ඩායමේ සාමාජිකයකුගේ මරණයෙන් හෝ මාදැල් ඒකකයක් විකිණීමෙන් හෝ පසු මාදැල් වාරය ක්‍රියා කරවීමේ අයිතිය, අවස්ථාවෝචිත විය හැකි පරිදි එම සාමාජිකයාගේ හෝ මාදැල් ඒකකය මිළ යට ගත් අයගේ හෝ උරුමක්කාරයාට හෝ උරුමක්කාරයින් හට නො ලැබිය යුතු ය."

7-770—73.07.20 අංක 69 දරන ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

(431 වැනි අධිකාරිය වන) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ අංක 5 (3) දරණ ඡේදය යටතේ ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හා ක්‍රමයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සිටි ඒ. ඇම්. ඇම්. සහබ්දීන් මහතාගේ පත්වීම අවලංගු කිරීමෙන් හා ඉවත් කිරීමෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීමට ඇස්. ඩබ්. ගුණවර්ධන මහතා 1973.04.02 දින සිට පත් කර තිබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ ඇමති.

7-586/1—73.07.20 අංක 69 දරන ගැසට් පත්‍රය

**දැන්වීමයි**

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හා ක්‍රමයේ අධ්‍යක්ෂ පදවියට ඒ. ඇම්. ඇම්. සහබ්දීන් මහතාගේ පත්වීම (431 වැනි අධිකාරිය වන) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ අංක 5 (2) දරණ ඡේදය යටතේ ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් 1973.03.01 දින සිට අවලංගු කර නිෂ්ප්‍රභා කර තිබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති.

7-586/2 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1967 අංක 10 දරණ වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා පනත**

1967 අංක 10 දරන වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා පනතේ 7 (1) වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බල තල අනුව, එච්. ජී. ඇරැව්වාවල, බී. කේ. රත්නකුමාර සහ ඇස්. ඇම්. බී. දොලපිහිල්ල යන මහත්වරුන් 1973 ජූනි මස 24 වැනි දින සිට වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයින් වශයෙන් නැවත පත්කිරීමට නැව් හා සංචාරක කටයුතු ඇමතිතුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම පත්වීම් යථෝක්ත පනතේ 7 වෙනි වගන්තියේ (4) සහ (6) දරන උපවගන්තිවල විධිවිධානයන්ට යටත් වේ.

තවද, ඉහත සඳහන් පනතේ 15 වෙනි වගන්තියේ (3) සහ (5) වෙනි උපවගන්තිවල විධිවිධානයන්ට යටත්ව එම වගන්තියේ (1) වෙනි උප වගන්තිය අනුව ඉහත සඳහන් එච්. ජී. ඇරැව්වාවල මහතා 1973 ජූනි මස 24 වෙනි දින සිට වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපති වශයෙන් නැවත පත්කිරීමට නැව් හා සංචාරක කටයුතු ඇමතිතුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා තවදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. බී. කරඳවල.
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 2 දින,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 1.

7-529/1 - -73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**1967 අංක 10 දරණ වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා පනත**

1967 අංක 10 දරන වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථා පනතේ 7 (1) වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල අනුව, ෂෙල්ටන් පී. අමරසේකර මහතා 1973 ජූනි මස 24 වැනි දින සිට වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයෙකු වශයෙන් පත්කිරීමට නැව් හා සංචාරක කටයුතු ඇමතිතුමා සතුටුවී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම පත්වීම යථෝක්ත පනතේ 7 වෙනි වගන්තියේ (4) සහ (6) දරන උපවගන්තිවල විධිවිධානයන්ට යටත් වේ.

පී. බී. කරඳවල,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 2 දින,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය,
කොළඹ 1.

7-529/2 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**අංක සී/අයි. 1191**

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2. සහ සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ්ක්‍රාෆ්ට්, 111, මීගමු පාර, පෑලියගොඩ.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

වැඩබලන කම්කරු ඇමති නැන්පත් දූල්වල ගලපිටගේ හේම චන්ද්‍ර සිරිසේන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිය මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සිරිමාවෝ කොලුගල්ල මහත්මිය, මහනුවර වෙත මෙයින් යොමු කරනු ලැබේ.

සී. ජී. එච්. සිරිසේන,
වැඩබලන කම්කරු ඇමති.

1973 ජූලි මස 03 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා ඉංජිනේරු කම්කරු සමිතිය, 71, මැලේ වීදිය, කොළඹ 2.
සහ
සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට්, 111, මීගමු පාර, පෑලියගොඩ.
අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ පහත නම් සඳහන් ලංකා ඉංජිනේරු කම්කරු සමිතියේ සාමාජිකයන් සීමාසහිත ඉම්ප්‍රෙග්නේෂන් ඇන්ඩ් වුඩ් ක්‍රාෆ්ට්හි පාලක පක්ෂය විසින් රැකියාවේ නොයෙදවීම යුක්තිසහගතද හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

| | |
|---|---|
| 1. කේ. ඩී. සී. අබේසිංහ | 9. එච්. ඒ. හේමපාල |
| 2. ඒ. ඇම්. නන්දසේන | 10. අයි. ආර්. ඒ. අබේගුණසේකර |
| 3. එච්. ඒ. නෝබට් | 11. එල්. සරත් |
| 4. වී. සිරිසේන | 12. එම්. ඒ. සුමනදාස |
| 5. ජයන්ත සී. ලියනගේ | 13. ආර්. ඒ. සිරිසේන |
| 6. සී. කේ. ප්‍රේමදාස | 14. ජී. ඇම්. පෙරේරා |
| 7. බී. නන්දසේන | 15. ඩබ්. ඒ. දයානන්ද |
| 8. ඒ. එම්. එම්. රවුෆ් | 16. කේ. ඇම්. චන්ද්‍රදාස |

17. ඒ. සුබ්‍රමනියම්

1973 ජූනි මස 22 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනා යොදන ලදී.

ජෝ. පී. ඒ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

7-558 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

අංක : පී. 7/1007

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡෙදය වන)—කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමඟ කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1973 මැයි මස 11 දින අංක 59 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1973 අප්‍රේල් මස 24 වන දින දරන නියෝගයෙන් සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10 සහ මීගමුව නගර සභාව මීගමුව., අතර ඇති 1973 අප්‍රේල් මස 02 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා කොළඹ 4, ශාන්ත පීතර පෙදෙසේ අංක 21 පදිංචි ඇම්. මතියාපරනම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින් වැඩබලන කම්කරු ඇමති වන දූල්වල, ගලපිටගේ හේමචන්ද්‍ර සිරිසේන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1973 අප්‍රේල් මස 24 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

ඩී. ජී. එච්. සිරිසේන,
වැඩබලන කම්කරු ඇමති.

1973 ජූලි මස 03 දින,
කොළඹ දීය.

7-626/1 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

අංක පී./1077

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10 සහ මීගමුව නගර සභාව, මීගමුව,

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

වැඩබලන කම්කරු ඇමති තැන්පත් දූල්වල ගලපිටගේ හේම චන්ද්‍ර සිරිසේන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිය මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 4, සා/පීතර පෙදෙසේ අංක 21 හි පදිංචි එම්. මතියාපරනම් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩී. ජී. එච්. සිරිසේන,
වැඩබලන කම්කරු ඇමති.

1973 ජූලි මස 03 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය,
67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.,
සහ
මීගමුව නගර සභාව, මීගමුව.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, මීගමුව නගර සභාවේ කේ. ඇස්. ඒ. පී. ප්‍රනාන්දු මහතා වෙනුවෙන් සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය විසින් කර ඇති පහත සඳහන් ඉල්ලීම් යුක්තිසහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1. 1963.10.27 දින සිට කේ. ඇස්. ඒ. පී. ප්‍රනාන්දු මහතා 780—10×42—1,200 වැටුප් පරිමාව මත හෝ ඔහු විසින් ඉටු කරන සේවයට සරිලන වැටුප් පරිමාවක තැබිය යුතුයි.
2. එකී නිලධාරියා දීර්ඝකාලීනව වෛද්‍ය නිවාඩු පිට සිටි සෑම අවස්ථාවන් හිම ප. පා. කො. වැද්දුම්කරු 1 වන ශ්‍රේණියේ වැඩ කොටසද ආවරණය වන සේ කරන ලද සේවය සඳහාත්, ඔහු මියගිය දිනයවූ 1970. 08. 08 වන දින සිට ප. පා. කො. විසින් එම පුරප්පාඩුව පිරවූ 1971. 10. 01 වන දින දක්වා කාලපරිච්ඡෙදය සඳහාත් මොහුට වැඩබලන දීමනා ගෙවිය යුතුය.
3. තම රාජකාරි සඳහා 1963.10.27 දින සිට පා පැදියක් ළඟ තබාගෙන පාවිච්චි කිරීම සඳහා මාසික ගමන් ගාස්තු වශයෙන් රුපියල් 7 බැගින් ගෙවිය යුතුයි.
4. නගර සභාවේ අනිකුත් සේවකයින්ට දී ඇති පරිදි මුදල් රෙගුලාසි අනුව නිවාඩු දුම්රිය බලපත්‍ර දිය යුතුයි.

1973 ජූනි මස 25 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ජෝ. පී. ඒ. සිරිවර්ධන,
වැඩබලන කම්කරු කොමසාරිස්.

7-626/2 --73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

අංක පී. 7/1102

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

